**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.12.30<br>පැය 0615 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/2923 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


# 2026 අළුත් අවුරුදු උදාව නිමිත්තෙන් කොළඹ නගරය, ගාලු මුවදොර ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන රථවාහන සැලැස්ම.

2026 නව වසර සැමරීම සඳහා 2025.12.31 වන දින කොළඹ නගරය වෙත පිට පළාත් වලින් නව වසර උදාව සැමරීම සඳහා විශාල ජනතාවක් සහ රථවාහන ප්‍රමාණයක් කොළඹ නගරය වෙත විශේෂයෙන් ගාලු මුවදොර ප්‍රදේශය වෙත පැමිණීම අපේක්ෂා කරනු ලැබේ. එසේ පැමිණීමේදී ඇතිවිය හැකි රථවාහන තදබදය අවම කර ගැනීම සඳහා හා එම ජනතාවගේ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් විශේෂ රථවාහන සැලැස්මක් හා ආරක්ෂක සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

නව වසර උදාව හේතුකොට ගෙන විශේෂයෙන් කොළඹ නගරයේ කොටුව, පිටකොටුව, කොම්පඤ්ඤවීදිය, මරදාන, කොල්ලුපිටිය, බම්බලපිටිය හා කුරුඳුවත්ත යන පොලිස් වසම් වල මෙසේ අධික රථවාහන තදබදයක් ඇතිවිය හැකි බවට අපේක්ෂා කරනු ලැබේ. **එසේ වුවද, 2025.12.31 වන දින මෙම පොලිස් වසම් වල සාමාන්‍ය පරිදි රථවාහන ගමනාගමනය සිදු කරන අතර අධික රථවාහන තදබදයක් ඇතිවන අවස්ථා වලදී පමණක් අවස්ථානුකූලව පහත පරිදි රථවාහන ගමනාගමනය සිදු කිරීමට සැලසුම් කර ඇත.**

- ගාලු මැද පාර ඔස්සේ කොළඹින් පිටවීම - එන්.එස්.ඒ. වටරවුම, ගාලු මැද පාර, බාලදක්ෂ මාවත හන්දියෙන් වමට (එම්ඕඩී හන්දිය) බාලදක්ෂ මාවත, අලියා නාන වටරවුම, මාකන් මාකර් මාවත, ගාලු මුවදොර වටරවුම ඔස්සේ කොල්ලුපිටිය දෙසට ගමන් කිරීම.
- ගාලු මැද පාර, ගාලුමුවදොර වටරවුම සිට කොළඹට ඇතුළු වන රථවාහන බාලදක්ෂ මාවත හන්දිය දක්වා සහ ඉන් ඉදිරියට ගමන් කිරීම.
- ගාලු මුවදොර වටරවුමේ සිට මාකන් මාකර් මාවත ඔස්සේ අලියා නාන වටරවුම දෙසට හෝ අලියා නාන වටරවුම දෙස සිට බාලක්ෂ මාවත ඔස්සේ ගාලු මැද පාරට ගමන් කල නොහැක.
- බාලදක්ෂ මාවතේ අතුරු මාර්ග වලින් පැමිණෙන සියලු වාහන දකුණට හරවා අලියා නාන වටරවුම ඔස්සේ කොළඹින් පිටවිය හැකි අතර ගාලු මැද පාරට අතුරු මාර්ග වලින් ඇතුළු වන සියලුම වාහන දකුණට හරවා එන්එස්ඒ වටරවුම දෙසට ගමන් කිරීම.

ඉහත රථවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදි කොළඹ නගරයේ පදික වේදිකා මත සහ ප්‍රධාන මාර්ගයන් අවහිර වන ලෙස කිසිදු රථවාහනයක් නවතා තැබීමට ඉඩ ලබා නොදෙන අතර එවැනි ආකාරයට රථවාහන නීති උල්ලංඝණය කරනු ලබන රියදුරන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම රථවාහන හා ආරක්ෂක රාජකාරි සඳහා පොලිස් නිලධාරීන් 1200 ක් පමණ ප්‍රමාණයක් යෙදවීමට සැලසුම්කර ඇත.

**මෙසේ කොළඹට පැමිණෙන රථවාහන පහත සඳහන් රථගාල් වල ගාල් කර තැබීමේ පහසුකම් සලසා ඇති අතර එම රථගාල්වල රථවාහන 5900 කට පමණ ගාල් කිරීමේ පහසුකම් සලසා ඇත.**

- පහත සඳහන් නිදහස් රථගාල් හා මාර්ග දෙපස මුදල් අයකර ගැනීමකින් තොරව රථවාහන අවහිරතා ඇති නොවන පරිදි ගාල්කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.
  - ✓ කොටුව පොලිස් වසමේ බාලක්ෂ මාවත - එම්.ඕ.ඩී රථගාල (බේරේවැව දෙසට)
  - ✓ කොල්ලුපිටිය/බම්බලපිටිය/වැල්ලවත්ත මුහුදුබඩ මාර්ග
  - ✓ කොටුව හා මරදාන පොලිස් වසම් වල ඩී.ආර්.විජේවර්ධන මාවත
  - ✓ කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේ පාසන්ස් පාර පිටවීමේ තීරුව පමණක්
  - ✓ ගාලු පාර වැල්ලවත්ත සැවෝයි අසල සිට ගාලු පාර බගතලේ පාර හන්දිය දක්වා රථ නැවතුම් ස්ථාන වල (Parking Bays)පමණක්
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ ආනන්ද කුමාරස්වාමි මාවත නෙළුම් පොකුණ වටරවුමේ සිට පුස්තකාල වටරවුම දෙසට ඇතුළු වීමේ තීරුව (වම්පස)
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ එෆ්.ආර්.සේනානායක මාවත
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ රීඩ් මාවත රීඩ් රාජකාරී හන්දියේ සිට රීඩ් මාවත රීඩ් තර්ස්ටන් හන්දිය දක්වා මාර්ගයේ දකුණු පස
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ නිදහස් මාවත නිදහස් වටරවුමේ සිට නිදහස් චතුරස්‍රය දක්වා මාර්ගයේ දකුණු පස
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ මෙට්ලන්ඩ් පෙදෙස
  - ✓ කුරුඳුවත්ත පොලිස් වසමේ පදනම් ආයතනය පාර
- පහත සඳහන් රථගාල් සහ මුදල් අයකිරීමේ පදනම මත රථගාල් කිරීම සඳහා අවස්ථාව සලසා ඇත.
  - ✓ පිටකොටුව පොලිස් වසමේ බැස්ටියන් මාවත පරණ මැනිං වෙළඳ සංකීර්ණ රථගාල
  - ✓ කොටුව පොලිස් වසමේ විමලධර්මසූරිය ඔර්ලෝසු කණුව අසල රථගාල
  - ✓ කොටුව පොලිස් වසමේ රාසික් ෆරීඩ් මාවත හේමාස් රථගාල
  - ✓ ඩී.ආර්. විජේවර්ධන මාවත ලේක් හවුස් රථගාල
  - ✓ කොටුව පොලිස් වසමේ ලේඩින් බැස්ටියන් මාවත
  - ✓ කොටුව පොලිස් වසමේ බ්‍රිස්ටල් වීදිය
  - ✓ කොටුව පොලිස් වසමේ ඩියුක් වීදිය

- ✓ කොම්පඤ්ඤ්වීදිය පොලිස් වසමේ යූනියන් පෙදෙස ඩෝසන් වීදිය හන්දිය ඇක්සස් ටවර් රථගාල
- ✓ මරදාන පොලිස් වසමේ ගාමිණී වටරවුම - St' Clement රථගාල

මෙම සැලැස්මට අනුව රථවාහන ගමන් කිරීම සම්බන්ධ වූ සිතියම් 04 ක් ඔබවෙත යොමු කරන අතර මහජනතාවට හා රියදුරන්ට සිදුවන අපහසුතාවයය මගහරවා ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.

## Special Traffic Plan to Be Implemented in Colombo and Galle Face for New Year 2026

A special traffic and security plan will be implemented in Colombo City and the Galle Face area in view of the New Year celebrations scheduled for 31 December 2025, according to the Sri Lanka Police.

Police anticipate a large influx of people and vehicles into Colombo, particularly to the Galle Face Green area, from suburban and outstation locations to welcome the New Year 2026. In order to reduce possible traffic congestion and ensure the safety of the public, comprehensive traffic management and security measures have been arranged.

Heavy traffic congestion is expected in the Fort, Pettah, Company Street, Maradana, Kollupitiya, Bambalapitiya, and Kurunduwatte Police Divisions. Traffic in these areas will function as usual on 31 December 2025; however, if severe congestion arises, the following traffic diversions and regulations will be enforced as required.

**Proposed Traffic Arrangements**

- Vehicles exiting Colombo via Galle Face Middle Road will be diverted from the NSA Roundabout along Galle Face Middle Road, turning left at Baladaksha Mawatha Junction (MOD Junction), proceeding through Baladaksha Mawatha, Aliya Nana Roundabout, Markan Marker Mawatha, and then towards Kollupitiya via the Galle Face Roundabout.
- Vehicles entering Colombo from Galle Face Middle Road will be permitted to proceed from the Galle Face Roundabout to Baladaksha Mawatha Junction and onwards.
- Travel from Galle Face Roundabout to Aliya Nana Roundabout via Markan Marker Mawatha, and from Aliya Nana Roundabout to Galle Face Middle Road via Baladaksha Mawatha, will be restricted.
- Vehicles entering from the by-roads of Baladaksha Mawatha will be allowed to turn right and exit Colombo through the Aliya Nana Roundabout, while vehicles entering Galle Face Middle Road from by-roads must turn right and proceed towards the NSA Roundabout.

Police further stated that, during the implementation of this traffic plan, parking will be strictly prohibited on pavements and main roads within Colombo City. Legal action will be taken against motorists who violate traffic regulations.

Approximately 1,200 police officers will be deployed to carry out traffic control and security duties during the New Year celebrations.

**Parking Facilities for the Public**

Parking facilities have been arranged to accommodate approximately 5,900 vehicles arriving in Colombo. The following locations will be available **free of charge**, including designated roadside parking areas where no traffic obstruction is caused:

- Baladaksha Mawatha, Fort Police Division – MOD Car Park (towards Beira Lake)
- Coastal Roads in Kollupitiya, Bambalapitiya, and Wellawatte
- D.R. Wijewardena Mawatha (Fort and Maradana Police Divisions)
- Parsons Road Exit Lane (Company Street Police Division – limited area)
- Galle Road, Wellawatte (from Savoy area to Bagathale Road Junction – designated bays only)
- Ananda Coomaraswamy Mawatha (Kurunduwatte Police Division – left entry lane from Nelum Pokuna Roundabout to Library Roundabout)
- F.R. Senanayake Mawatha, Kurunduwatte Police Division
- Reid Mawatha (right side, from Reid Rajakariya Junction to Thurstan Junction)
- Independence Avenue (right side from Independence Circle to Independence Square)
- Maitland Place, Cinnamon Gardens Police Division
- Foundation Institute Road, Cinnamon Gardens Police Division

The following **paid parking facilities** will also be available:

- Old Manning Commercial Complex Parking Lot, Bastion Mawatha (Pettah Police Division)
- Wimaladharmasuriya Clock Tower Parking Area (Fort Police Division)
- Hemas Parking Lot, Razik Fareed Mawatha (Fort Police Division)
- Lake House Car Park, D.R. Wijewardena Mawatha
- Leyden Bastion Mawatha (Fort Police Division)
- Bristol Street and Duke Street (Fort Police Division)
- Access Tower Car Park, Union Place–Dawson Street Junction (Company Street Police Division)
- St. Clement’s Car Park near Gamini Roundabout (Maradana Police Division)

Police stated that four traffic route maps relevant to the above arrangements have been issued and requested the media and the public to give wide publicity to this information to minimize inconvenience to motorists and pedestrians.

**Police Media Division**